*සැ. යු.-* 2013.01.11 දින පළ වූ අංක 1,793 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV (ආ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,794 - 2013 ජනවාරි මස 18 වැනි සිකුරාදා - 2013.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 242 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 පෙබරවාරි මස 08 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජනවාරි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
*රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

**1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ II පරිච්ඡේදයේ 5 (1) යටතේ කරනු ලබන දැන්වීම**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ II වැනි උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥාපනතේ II වැනි පරිච්ඡේදයේ 5 (1) වගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂයභාර අමාත්‍ය වන අතුල සරත් කුමාර විජේසිංහ වන මවිසින් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් සුසාන මලමිනී වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස පොදු සුසාන ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

නීතිඥ අතුල සරත් කුමාර විජේසිංහ,
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
වයඹ පළාත් සභාව.

2012 ඔක්තෝබර් මස 02 වැනි දින,
කුරුණෑගල ප්‍රධාන අමාත්‍ය කාර්යාලය.

**උපලේඛනය**

*1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ II පරිච්ඡේදයේ 5 (1) වගන්තිය ප්‍රකාර කොනොත්ත මිනීපිටිය ප්‍රකාශයට පත් කිරීම*

වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොනොත්ත ගමෙහි අ.ග.පි. 2687 පත්‍ර අංක 18/4 හි මිනීපිටිය හේන නමැති ඉඩමේ කැබලි අංක 74

| | | |
|---|---|---|
| ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | - | වාරියපොල |
| ග්‍රාම නිලධාරි වසම | - | 1280 කොනොත්ත |
| ගම | - | කොනොත්ත |
| ඉඩමේ නම | - | මිනීපිටිය හේන |

*මායිම්.-*

| | | |
|---|---|---|
| උතුරට | - | කැබලි අංක 72 සහ 73, |
| නැගෙනහිරට | - | කැබලි අංක 73, |
| දකුණට | - | කැබලි අංක 73, |
| බටහිර | - | කැබලි අංක 204 මායිම් වූ ප්‍රමාණයේ හෙක්ටයාර් 0.157ක් වූ භූමිය. |

01-454

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.